## කලවාන ප්‍රාදේශීය සභාව
## රත්නපුර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය 2014 මැයි 27 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 03 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 01 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 අහිතකර මතය

------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට කලවාන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිත අංක 01 හි 21 ඡේදයට අනුව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු පහත සඳහන් ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

(i.) මුදල් ප්‍රවාහ ප්‍රකාශය.

(ii.) වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ආදාහනාගාරය ඉදිකිරීම සඳහා දේශීය ණය හා සංවර්ධන අරමුදල මගින් ලබාගත් ණය මුදලේ ඉකුත් වසරට අදාල පොලී වශයෙන් සමාලෝචිත වර්ෂය තුල ගෙවන ලද රු. 106,187 ක මුදල සමාලෝචිත වර්ෂයේ වියදමට ගලපා තිබූ බැවින් උක්ත අගයෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය අඩු වී තිබුණි.

(ආ) ආදාහනාගාරය ඉදිකිරීම වෙනුවෙන් රු. 3,290,135 ක් හා බස් නැවතුම්පල ඉදිකිරීම වෙනුවෙන් රු. 1,338,475 ක් ලෙස එකතුව රු. 4,628,610 ක් දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු වුවද, මූල්‍ය ප්‍රකාශනයන්හි දේශීය ණය සංවර්ධන අරමුදල් යටතේ රු. 306,068 ක හර ශේෂයක් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු. 363,000 ක් ලෙස හඳුනාගෙන තිබියදී, බිල්කල ආදායම රු. 800,000 ක් ලෙස දැක්වීමෙන් මූල්‍ය ප්‍රකාශනයෙහි උසාවි දඩ ආදායම රු. 437,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. තවද, රු. 383,000 ක්වූ ලැබිය යුතු ආදායම් සමාලෝචිත වර්ෂය අවසානයේ රු. 562,771 ක් ලෙස දැක්වීමෙන් ජංගම වත්කම් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) බලවින්න කොන්ක්‍රීට් අංගනයේ ණය මුදලක් පියවීම සඳහා ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායමින් රු. 119,191 ක් පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් සෘජුවම අඩුකර එකී ආයතනයට යොමු කිරීමෙන් ප්‍රාදේශීය සභාවේ මුද්දර ගාස්තු ආදායම් වශයෙන් ගිණුම්ගත කල යුතු රු. 119,191 ක මුදල සමාලෝචිත වර්ෂයේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට තථ්‍ය වශයෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු. 6,277,700 ක් වුවද, මුද්දර ගාස්තු ගිණුමට අනුව උක්ත අගය රු. 1,964,341 ක් ලෙස දැක්වීමෙන් ජංගම වත්කම් රු. 4,313,359 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුලදී මිලදී ගත් රු. 430,000 ක වටිනාකමින් යුත් වත්කම් ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුම හරහා ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(උ) එකතු කල අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු හා මුද්දර ගාස්තු ලෙස දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට රු. 701,673 ක් ගෙවිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනයෙහි දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානයට එවැනි බැදීමක් තහවුරු වී නොතිබුණි.

(ඌ) මාර්ග නඩත්තු වැඩසටහන යටතේ තපස්සරකන්ද සුරුට්ටුවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් ලද රු. 637,426 ක් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආධාර යටතේ ආදායමට ගෙන වියදම් කිරීම වෙනුවට සභාවේ පොදු තැන්පත් ගිණුම යටතේ වියදම් කර තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ තැන්පත් වශයෙන් ලද රු. 574,590 ක් ප්‍රධාන මුදල් ගිණුම හරහා ගිණුම්ගත නොකර සභාවේ වෙනම තැන්පත් මුදල් පොතකට ගෙන වියදම් කර තිබුණි.

(ඒ) විදේශ පුහුණු වැඩසටහනක් සඳහා අත්තිකාරම් ලෙස සමාලෝචිත වර්ෂය තුලදී ගෙවන ලද රු. 35,000 ක මුදලක් නිරවුල් කිරීමකින් තොරව වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඔ) වැටුප් ප්‍රතිපූර්ණ මුදල් සහ මන්ත්‍රීවරුන්ගේ දීමනාද ඇතුලත්ව සමාලෝචිත වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණ ආදායම රු. 8,157,667 ක් වුවද, බිල් කල ආදායම රු. 8,756,130 ක් ලෙස දැක්වීමෙන් සමාලෝචිත වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණ ආදායම රු. 598,463 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු එම ආදායම රු. 1,748,186 ක් වුවද, ලෙජර් ගිණුම මඟින් රු. 1,716,686 ක් ලෙස දක්වා තිබීමෙන් ලැබිය යුතු ආදායම් රු. 31,500 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඕ) ප්‍රමාණය හා හේතු වූ කරුණු නිශ්චිතව හඳුනා ගැනීමකින් තොරව වැටුප් ප්‍රතිපූර්ණ හා මන්ත්‍රී දීමනා ගිණුමට රු. 223,000 ක් බැර කර එම වටිනාකම සමුච්චිත අරමුදල් ගිණුමට හරකර තිබුණි.

(ක) වර්ෂ ගණනාවක සිට නිරවුල් නොකරන ලද රු. 926,758 ක් වටිනාකමැති ණයහිමි ශේෂ නිරවුල් කිරීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුලදී කිසිඳු පියවරක් ගෙන නොතිබුණි.

(ග) සමාලෝචිත වර්ෂයට අදාල රු. 147,524 ක වියදම් ණයහිමියෝ වර්ෂයේ වියදමට ගෙන නොතිබුණි.

(ච) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු ලේඛණ හා එම ලෙජර් ගිණුමේ ශේෂය අතර පැවති රු. 2,798,962 වෙනස හඳුනා ගැනීමකින් හා කිසිඳු අනුමැතියකින් තොරව සමුච්චිත අරමුදලට එරෙහිව කපා හැර තිබුණි.

(ජ) සමාලෝචිත වර්ෂයේදී වරිපනම් බදු සඳහා දුන් වට්ටම් රු. 40,693 ක් වර්ෂයේ වියදමට නොගෙන සමුච්චිත අරමුදලට ගලපා තිබුණි.

(ට) ප්‍රධාන කාර්යාලයේ හා උප කාර්යාලයේ වෙළඳ බලපත්‍ර ආදායම් ලෙස රු. 963,950 ක් හඳුනාගෙන ඇතත්, රු. 1,037,321 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් රු. 73,371 ක් වැඩිපුර ගිණුම්ගත කල මුදල හඳුනාගෙන නිවැරදි කිරීම වෙනුවට සමුච්චිත අරමුදල් ගිණුමට කපා හැර තිබුණි.

(ඩ) සමාලෝචිත වර්ෂයේදී පොදු වෙළඳපල කඩකුලී (5-22) යටතේ වෙනත් අය ශීර්ෂයක ලැබීම්ද සමඟ රු. 1,203,172 ක් සාවද්‍ය ලෙස ගිණුම්ගත වීම නිවැරදි කිරීම සඳහා අදාල අය ශීර්ෂය හඳුනාගෙන එම අය ශීර්ෂයට නියමිත මුදල මාරු කිරීම වෙනුවට ජ'නල් සටහන් අංක 21 මඟින් රු. 246,482 ක මුදලක් සමුච්චිත අරමුදල් ගිණුමට මාරු කර තිබුණි.

(ත) මාර්ග තලනය 2009 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ සංස්ථාව සමඟ ගිවිසුමක් මත කුළියට දීම තුලින් රු. 1,864,007 ක ආදායමක් ලැබිය යුතුව තිබූ අතර, එම හිඟයෙන්

සමාලෝචිත වර්ෂයේදී ලදුපත් අංක 23318 මගින් රු. 150,000 ක මුදලක් ලැබී එම මුදල සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. තවද, උක්ත ආයතනයෙන් අයවීමට තිබූ හිඟ මුදල වූ රු. 1,714,007 ක් ලැබිය යුතු ගිණුම් ශේෂයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ද) 2013 භාණ්ඩ සමීක්ෂණ වාර්තා මගින් විනාශ කිරීම හා වෙන්දේසි කිරීම සඳහා නිර්දේශ කරන ලද රු. 1,271,315 ක් වටිනාකමැති භාණ්ඩ පිළිබඳ නියමිත නිර්දේශ 2014 අගෝස්තු 06 දින වන තුරුද ක්‍රියාත්මක කර නොතිබූ අතර, නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පෙර ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමට හා ස්ථාවර වත්කම් ගිණුම් තුලට ගැලපීම් කර තිබුණි.

## 1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගිණුම් විෂයයන් 10 කට අදාලව 2013 දෙසැම්බර් 31 දිනට පාලන ගිණුම අනුව ශේෂ එකතුව රු. 14,891,925 ක්වූ අතර, උපයෝගී ලේඛණ අනුව ශේෂයන්ගේ එකතුව රු. 19,090,911 ක් වූයෙන් වෙනස රු. 4,198,986 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ණයහිමියන්ට වෙන් කරන ලද රු. 4,756,785 ක ශේෂය වැය ශීර්ෂයන්ට ගැලපීමේදී අඩු හා වැඩි වීම් සිදු වී තිබුණි.

## 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුලත් එකතුව රු. 62,340 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාල ශේෂයන් තහවුරු කර ගැනීම සඳහා සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

## 1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

----------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | අනුකූල නොවීම්. |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඔ) වගන්තිය | විෂයයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව පූණ්‍ය හා සුභසාධන කටයුතු වෙනුවෙන් අවස්ථා 04 කදී රු.63,500 ක මුදලක් ගෙවා තිබුණි. |
| (ආ) | <u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය - 1992</u><br>මුදල් රෙගුලාසි අංක 371 (2) | රු.246,000 ක් වූ අත්තිකාරම් එපරිදි පියවීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ මෙහෙයුම් අයභාරය රු. 8,447,530 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ මෙහෙයුම් අයභාරය රු. 3,844,692 ක් විය.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පසුගිය වර්ෂයන්ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් අතිරික්තය සියයට 120 කින් වැඩිවී ඇති අතර, පසුගිය වර්ෂයන්ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් වැඩිවීම ඊට ප්‍රධාන වශයෙන් බලපා ඇත.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 6,498 | 1,610 | 3,925 |
| බදු කුලී | 970 | 6,511 | 128 |
| බලපත්‍ර ගාස්තු | 1,187 | 1,331 | - |
| වෙනත් ආදායම් | 13,772 | 20,420 | 389 |

#### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත හා රැස්කල ආදායම සැසඳීමේදී වරිපනම් හා බදු ආදායමෙහි ඇස්තමේන්තුගත ආදායමට වඩා රැස්කල ආදායමෙහි සියයට 303 ක අඩුවීමක් පෙන්නුම් කෙරේ.

#### 2.3.3 වරිපනම් බදු

විගණිත දිනය වූ 2013 සැප්තැම්බර් 30 දිනට මුළු හිඟ වරිපනම් බදු ප්‍රමාණයෙන් සියයට 43 ක ප්‍රතිශතයක් රු. 5,000 ට වැඩි ශේෂ වන අතර, එම වටිනාකම රු. 1,380,130 ක් විය. එය මුළු වරිපනම් ඒකක වලින් සියයට 12 ක ප්‍රතිශතයකි. මේ අනුව අඩු ඒකක ප්‍රතිශතයකින් වැඩි වරිපනම් ගාස්තුවක් අයකර ගැනීමට අවස්ථාව තිබූ අතර, ඒ පිළිබඳව අවධානය යොමු කර හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර

නොතිබුණි. තවද, වසර 01 සිට වසර 49 දක්වා බදු ගෙවීම් පැහැර හැරීම් සිදු කල අවස්ථාද නිරීක්ෂණය විය.

2.3.4 වෙනත් ආදායම්

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 වර්ෂය සඳහා සභාවේ ලියාපදිංචි වී ඇති කුළී ලොරි රථ 25 ක්, ත්‍රීරෝද රථ 119 ක් හා වෑන් රථ 15 ක් වන අතර, මසකට අයකරන ගාස්තුව පිළිවෙලින් රු. 445 ක්, රු.134 ක් හා රු. 150 ක් වේ. ගාස්තු අය කිරීම පිළිවෙලින් රු. 93,500 ක්, රු. 191,352 ක් හා රු. 27,000 ක් ලෙස අතුරු ව්‍යවස්ථා පනවා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2011, 2012 සහ 2013 වර්ෂ සඳහා වෙළඳුන් 15 දෙනෙකුගෙන් අයවිය යුතු එළිමහන් වෙළඳාම් ගාස්තු පිළිවෙලින් රු. 111,340 , රු. 58,080 හා රු. 46,680 ක් වූ එකතුව රු. 216,100 ක හිඟ ආදායම් ප්‍රමාණයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුගේ අසනීප තත්ත්වයක් හේතුවෙන් ඔහුට දරන්නට වූ ගමන් වියදම් රු. 28,500 ක් පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමට යටත්ව ගෙවීමටත්, පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය නොලදහොත් මන්ත්‍රීවරයාගෙන් අය කර ගැනීමේ එකඟතාවය මත සභා අනුමැතිය අනුව ගෙවා තිබූ අතර, විගණිත දිනය වූ 2014 අගෝස්තු 06 දින වනවිටත් පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලැබී නොමැති බැවින්, මන්ත්‍රීවරයාගෙන් අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි

3.2 අවිධිමත් ගනුදෙනු

-----------------------

සභාවේ අංක ඩබ්පී එල්එෆ් 4827 දරන කැබ් රථය ධාවන තත්ත්වයේ තිබියදී 2013 ජනවාරි, පෙබරවාරි, මාර්තු, අප්‍රේල් සහ සැප්තැම්බර් යන මාස 05 සඳහා ද එක් මසකට රු. 120,000 බැගින් එකතුව රු. 600,000 ක ප්‍රමාණයක් විෂයයභාර අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව සභාපතිතුමාගේ ගමන් බිමන් සඳහා භාවිතයට ගත් පුද්ගලික වාහනයත් සඳහා කුළී ගෙවීම් කර තිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

කලවාන පොදු වෙළඳ සංකීර්ණය සහිත බස් නැවතුම්පල ඉදිකිරීම සඳහා 2009 වර්ෂයේ සැලසුම් කර රු.8,867,228ක මුදලකට ගිවිසුම්ගතවී එදින සිට මෙම වාර්තාවේ දිනය දක්වා රු.7,704,504ක් වැයකර තිබුණි. මෙම කර්මාන්තය අතහැර දමා තිබුණෙන් ප්‍රතිලාභ ලැබීමට අපේක්ෂිත පාර්ශව සඳහා ප්‍රතිලාභ ලැබීම දිගින් දිගටම ප්‍රමාද වන බවත් නිරීක්ෂණය විය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

------------------------

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීතී මාලාවේ 5(7) ප්‍රකාරව මූල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා ගෙනයාම සභාපතිවරයාගේ
කාර්යයක් වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

4.2 අයවැය පාලනය

-------------------

වැය විෂයයන් 16 කට අදාලව සලසා තිබූ ප්‍රතිපාදන වලින් රු. 16,443,585 ක ප්‍රතිපාදනයක් සමාලෝචිත වර්ෂය අවසානයේදී ඉතිරි වී තිබූනි.

5. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(i) ගිණුම්කරණය

(ii) ආදායම් පරිපාලනය

(iii) අයවැය පාලනය

(iv) කොන්ත්‍රාත් පරිපාලනය